# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1859/24 - 2014 අප්‍රේල් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2014.04.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුව පිරවීම**

මිය යාම හේතු කොට ගෙන වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

නංහාමිගේ පියදාස නම් වූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නිශ්චිත කාල පරිච්ඡේදය ඇතුළත නාමයෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී පොන්නුතුරෙයි කුගනාදන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් 2011 වර්ෂයේ මාර්තු මස 17 වැනි දින වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේදී තෝරා පත් කරගත් අවසාන සභිකයා ළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබාගත් වීරසිංහ දිසානායගේ අචිර කැලුම් සම්පත් දිසානායක මහතා ඒ පුරප්පාඩුව ඇතිවූ වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කර සිටිමි.

පී. කුගනාදන්,<br>
තේරීම්භාර නිලධාරී,<br>
වවුනියා දකුණ සිංහල ප්‍රාදේශීය සභාව.

2014 අප්‍රේල් මස 01 වන දින,<br>
මැතිවරණ කාර්යාලය,<br>
වවුනියාව.

05 - 182


1A - G 19435— 75 (2014/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*